# 08. සාම්ප්‍රදායික යෙදුම්

භාෂාවක ඇතැම් වචන එහි වාච්‍යාර්ථය ඉක්මවා වෙනත් අර්ථයක් හඟවයි. එවැනි භාෂා ප්‍රයෝග ඒ බසට ම ආවේණික වෙයි. යම් කිසි කරුණක් හැඟීම්බර ව ප්‍රකාශ කරන්නට අවශ්‍ය වූ විටක මෙවැනි යෙදුම් භාවිතයට ගැනේ. මේවා වෙනස් බසකට පරිවර්තනය කිරීමට පුළුවන්කමක් නැත. සිංහල වාක් සම්ප්‍රදය, හෙළ ඌරුව, හෙළ ආර, සිංහල රීතිය වැනි නම්වලින් ද මේවා හැඳින්වේ.





**පරංගියා කෝට්ටේ ගියා වගේ**

ක්‍රි.ව. 1505දී ඉන්දියාවේ ගෝව බලා යාත්‍රා කළ පෘතුගීසි නෞකාවක් කුණාටුවකට හසු වී ගාලු වරායට සේන්දු විය. ගාල්ලෙන් කොළඹ බලා යාත්‍රා කළ එම නෞකාව කොළඹ වරායේ නැංගුරම් ලා ගත්තේ ය. එවකට කෝට්ටේ රාජ්‍ය විචාලේ 8 වැනි ධර්ම පරාක්‍රමබාහු රජතුමා ය. මේ විදේශීය නාවිකයන් ගැන කණ වැකුණු රජතුමා ඔවුන් පිළිබඳ තොරතුරු සොයා බලන්නට ඇමතියෙකු පත් කළේ ය.


නැව්පතියා හමු වූ ඇමතිවරයාට දැනගන්නට ලැබුණේ පෘතුගීසීන් සිංහල රජතුමා සමග වෙළෙඳ ගිවිසුමක් ඇති කරගන්නට කැමති බවත් ඒ සඳහා රජතුමා හමුවීමට අවකාශ ලබා දෙන ලෙසත් ය. මේ බව රජුට දන් වූ විට පෘතුගීසීන්ගේ යුද්ධ ශක්තිය පිළිබඳ දැන සිටි රජතුමා ඇමතිට අණ

කළේ එක එල්ලේ කොළඹ වරායේ සිට කෝට්ටේ මාලිගය කරා කැඳවා ගෙන නොයන ලෙසත්, කෝට්ටේ රාජධානිය බොහෝ දුර පිහිටා ඇති බව හඟවනු සඳහා ඈතට කැඳවා ගෙන ගොස් බොහෝ පමා කොට මාලිගාවට කැඳවන ලෙස ය. රාජ නියෝගය ලත් රාජ පුරුෂයෝ මෙසේ ආ පෘතුගීසි පිරිස කළුතර දක්වා කැඳවා ගෙන ගොස් රට මැදින් කෝට්ටේ රාජධානියට කැඳවා ගෙන ආහ. ඉතා කෙටි කාලයකින් කෝට්ටේ රාජධානියට ළඟා විය හැකි ව තිබුණ ද මෙම ගමන සඳහා දින කීපයක් ගත විය.

මෙම ඓතිහාසික සංසිද්ධිය පසුබිම් කොට ගෙන ''පරංගියා කෝට්ටේ ගියා වගේ'' යන පිරුළ ජන වහරට එක් විය. මෙයින් ගම්‍ය වන්නේ ඉතා පහසුවෙන් කළ හැකි දෙයක් සඳහා අනවශ්‍ය ලෙස දිගු කාලයක් හා ශ්‍රමයක් වැය කරන බවයි. අර්ථ විරහිත ලෙස කාලය හා ශ්‍රමය වැය කිරීම නිශ්ඵල අර්ථ ශූන්‍ය දෙයක් බව වටහා දීම මෙහි ලක්ෂ්‍යාර්ථයයි.

අපි තවත් උදාහරණයක් සලකා බලමු.

නන්ද කුමරු ශාසනයෙහි අභිරතියක් නැතිව, **එළිපත්ත උඩ සිටීම** භික්ෂූන්ට ගැටලුවක් විය.



මෙම වාක්‍යයේ නන්ද කුමරු එළිපත්ත උඩ සිටීම යන්නෙන් එහි වාච්‍යාර්ථය නොගැනේ. නන්ද කුමරු ගිහිගෙයටත් පැවිද්දටත් දෙකට ම නොමැතිව ජනපද කල්‍යාණී ගැන සිතමින් මානසික ව දෝලනය වූ බවක් මෙයින් අදහස් කෙරේ.

පහත උදාහරණය අවධාරණය කරමු.

චිංචිමාණවිකා තොමෝ බුදුන්ට **පදයක් හදන්නට** සවස වෙහෙරට ගියා ය.

මේ වැකියෙහි පදයක් හදනවා යනු ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක්කොට අර්ථවත් ඒකකයක් නිර්මාණය කිරීමක් නොවේ. එය එහි වාච්‍යාර්ථයයි. එහෙත් පදයක් යනුවෙන් ගම්‍ය වන්නේ ඊට ඉදුරා ම වෙනස් වූ අර්ථයකි. චිංචිමාණවිකාවට අවශ්‍ය වන්නේ බුදුන් අවමානයට ලක් කිරීම ය.

පිරිස් බණ අසා වෙහෙරින් බැහැර වන අවස්ථාවේ ඕ වෙහෙර දෙසට යන්නීය. උපාසක පිරිස් වෙහෙරට යන විට ඈය වෙහෙර දෙස සිට පෙරළා එමින් සිටින්නී ය. මෙම සිද්ධිය උපාසක පිරිසට බුදුන් වහන්සේ පිළිබඳ කුතුහලයක් දනවීමට හේතු වන්නකි. චිංචිමාණවිකාවගේ අභිප්‍රාය වූයේ බුදුන් කෙරෙහි අවමානයක් ජනිත කරවීමයි. පදයක් හදනවා යන්නෙන් ගම්‍ය වන්නේ එම අදහසයි.

මේ ආකාරයට සිංහලයේ විවිධ අවස්ථා හරවත් ව හා රසවත් ව ඉදිරිපත් කිරීමේ මෙවලමකි, සාම්ප්‍රදායික යෙදුම්. විස්තරාත්මක ව පැවසිය යුතු යමක් ඉතා කෙටියෙන් එහෙත් සමස්තාර්ථය ම හැඟවෙන පරිදි ප්‍රකාශ කිරීමේ ශක්තිය භාෂාව සතුව ඇත. එබඳු ප්‍රයෝගයන්ගෙන් භාෂාව වඩා සජීවි වන අතර එය අර්ථපූර්ණ ද භාවපූර්ණ ද වෙයි. ඉහත දැක්වුණු

පරංගියා කෝට්ටේ ගියා වගේ
එළිපත්ත උඩ සිටීම
පදයක් හදන්නට

මේ ප්‍රකාශ තුළින් ඊට අදාළ සිදුවීම් කිසිදු අයුරකින් භාෂා භාවිතයෙන් ගම්‍ය වේ යැයි සිතිය නොහැකි ය. මෙම සාම්ප්‍රදයික යෙදුම් ඉඟිවැකි, පිරුළු හා ආප්තෝපදේශ යනුවෙන් වර්ගීකරණය වේ.

**ඉඟි වැකි** -

★ මොරසූරන වැස්ස
★ ඇම ගිල්ලා
★ මූණේ දැලි ගෑවා
★ දෙවියන් සිහිවුණා

- ගඟට ඉනි කපනවා
- දිව දෙකේ මිනිහෙක්
- පොත්ගුල්ලා
- ගලේ කෙටූ අකුරු
- එක මල්ලේ ලුණු කනවා
- අණ්ඩර දෙමළ

මේ ඉඟිවැකි හෙවත් රූඪිවලින් යමක් සිදු වූ ආකාරය පිළිබඳ ඉඟියක් ලබා දෙයි. මතු පිටින් පැවසෙන අදහසට ඉඳුරාම වෙනස් වූ අදහසක් ලබාදීමට ඉඟිවැකිය සමත් වේ. සිංහල භාෂාව ඉඟි වැකිවලින් පොහොසත් වූවකි. එබඳු ඉඟිවැකියකින් පවසන අදහසක් සිංහලයට ම ආවේණික වූවක් විනා අන් බසකට පරිවර්තනය නොකළ හැකි ය.

## ප්‍රස්තාව පිරුළු

මානව සංහතියේ පරපුරෙන් පරපුරට පැවත ආ ජීවන අත්දැකීම් සමුදය ඇතුළත් ප්‍රස්තාව පිරුළු මගින් අපේ ජීවිත පරිඥානය පුළුල් කරයි. සීමිත වචන සංඛ්‍යාවකට පරිමිත ප්‍රස්තාව පිරුළු ඒ මගින් පුළුල් ජීවන පරාසයක් පිළිබඳ අවබෝධය ලබා දෙයි. ප්‍රස්තාව පිරුළකින් කියවෙන පුළුල් අදහස ගැඹුරු ය. අර්ථවත් ය. භාෂාවේ ප්‍රාණවත් බව ඇති කරන ප්‍රස්තාව පිරුළු භාෂාවේ අනන්‍යතාව ආරක්ෂා කරයි.

- අලි මදිවට හරක්.
- අන්දරේ සීනි කෑවා වගේ.
- ආටානාටිය කියනවා වගේ.
- ඇඟිලි පහ ම එක වගේ ද?
- ඇසළ පෙරහැරට බෙරත් හිඟ ද?
- උපාසක බළල්ලුත් මීයන් අල්ලනවලු.
- කතාව දෝලාවෙන් ගමන පයින්.
- කිරියි පැණියි වගේ
- කීවොත් සඟ නසී. නොකීවොත් වෙහෙර නසී.
- කාපු පතේ පැහැරුවා වගේ.

ඒ අතරින් කිහිපයකි.

කොපමණ ගුණ කළත්
දුදනෝ නොවෙති යහපත්
කිරි දියෙනි දෙවියත්
අඟුරු සුදුවන කලෙක් නම් නැත්

ඇතෙක් වනේ කොළ කෑවට කිඩ කීවට දණ ගසාද
සුසික්කිතව ඇති කළාට උරුලෑවගේ ගඳ ඇරේ ද
මැණික් ගලේ පය හැපුනට කණෙක් ඇහිඳලා ගනී ද
කොතෙක් කිවත් මෝඩයාට උගේ ගතිය ඌ අරී ද?

''ආප්ත'' යනු දනුම් තේරුම් ඇති අත්දකීම්වලින් පිරිපුන් තැනැත්තන් හැඳින්වීම සඳහා භාවිත වන්නකි. ඔවුන්ගේ උපදෙස් ආප්තෝපදේශ නමින් ගැනේ. ඒවා ප්‍රස්තුත කාරණය එක එල්ලේ ප්‍රකාශ කරයි. එහෙයින් ඉඟිවැකිවල හෝ ප්‍රස්තා පිරුළුවල හෝ එන ප්‍රකාශනයනට වඩා මෙහි වෙනසක් වෙයි. ඒ වෙනස හුදෙක් වාච්‍යාර්ථය ම ඉස්මතු කොට දක්වීමයි.

ඉහත කවිවල ඇත්තේ එවැනි ඍජු ප්‍රකාශන කීපයකි. පහත සඳහන් ආප්තෝපදේශ විමසා බලමු.

- ★ යුද්දෙට නැති කඩුව කොස් කොටන්න ද?
- ★ කළ කළ දේ පල පල දේ.
- ★ උඩඟුකම විනාශයට මුල ය.
- ★ ඇවිද්ද පය දහස් වටී.
- ★ සොයන්නාට හම්බ වේ.
- ★ දේසේ හැටියට බාසේ.
- ★ උඩ පැන්නොත් බිම වැටේ.
- ★ පිරුණු කළේ දිය නොසැලේ.
- ★ ආරේ ගති නැරේ.
- ★ උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා

## ක්‍රියාකාරකම 8.1

පහත 'අ' තීරුවේ ඇති යෙදුම්වලට ගැළපෙන අදහස ''ආ'' තීරුවෙන් තෝරා ලියන්න.

| (අ) | (ආ) |
|---|---|
| * ගොලුබෙලි ගමන | * අසාධ්‍ය අවස්ථාවේදී |
| * සායම ගියා | * ඉතා සෙමින් වැඩ කිරීම |
| * තරු පෙනුණා | * විස්මයට පත් වීම |
| * මර ඇදේදි | * ඉතා අසීරුවෙන් යමක් කිරීම |
| * ගහන හෙණේ පැණි වරකාවටත් වදී | * හැංගි හොරා ක්‍රියා කිරීම |
| * පැදුරටත් නොකියා යයි | * කිසිම සඳහනක් හෝ සලකුණක් නොකොට පලා යෑම |
| * සුදු ලූණු පොඩි කිරීම | * මුල අමතක කොට දැමීම |
| * හොර ගල් ඇහිදිනවා | * විපත සියල්ලට පොදු බව |
| * නැගපු ඉනිමගට පයින් ගැසීම | * අවමානයට ලක් වීම |
| * අනුනවයෙන් බේරෙනවා | * අනුන් මුළා කිරීම |

## ක්‍රියාකාරකම 8.2

එක මල්ලේ ලුණු කාගෙන පණ දෙන්නට වගේ සිටිය ඔහු මගේ ඉහ මොළ කන්නට සැරසෙන විට මට දෙවියන් සිහි වුණා. එහෙත් කපන්න බැරි අත සිඹින්නේත් නැතිව මගේ සායමත් යන්න නොදී දස අතේ හිතා මතාලා මිනිහා කියන ගල් පැලෙන බොරු පලිප්පු දමා දමා කියද්දීත් මිහිහාගේ ගැටවලට අහුවන්නේත් නැතිව අත දීලා දත නියවන්නට වන බවත් දැන දැන ම යාළුකම් ඇටකුණා වන්නට කලින් මිනිහගේ බත්පතට වැලි දමන්නෙත් නැතිව මිනිහා හන්දාම සිදු වූ දේ නිසා මගේ නාහේ ළගට ගිලෙන්න කලින් මිනිහගේ ම කරේ ඒ උරවක්‍රමාලාව ලා යන්තම් පණ බේරා ගත්තා.

1. ඉහත ඡේදයේ ඇති සාම්ප්‍රදායික යෙදුම් යටින් ඉරි අඳින්න.

2. ඒවායින් කියවෙන අදහස ලියන්න.